**Lessons for Sri Lanka from Korea’s Experience in Innovation emphasized at LKI.**

August 21, 2024

The Lakshman Kadirgamar Institute of International Relations and Strategic Studies (LKI), in collaboration with the Embassy of South Korea, hosted a seminar titled "Economic Security in the Indian Ocean Region: Prospects for Collaboration between Sri Lanka and Republic of Korea" on 21st August 2024. The event focused on lessons Sri Lanka could learn from South Korea’s experience in science, technological innovation, and economic transformation.

Ambassador Ravinatha Aryasinha, LKI's Executive Director, emphasized Sri Lanka's need to improve its low Research and Development (R&D) expenditure and foster a more innovation-driven society. H.E. Miyon Lee, Ambassador of Korea, highlighted the relevance of factors such as: economic security, technological leadership, protection of intellectual property rights and building an innovation ecosystem in Korea's growth. She identified areas for Sri Lanka's progress, such as export-oriented policies and foreign direct investment.

Dr. Kyungjin Song from the Asia Foundation Korea Office discussed South Korea’s historical economic transformation and proposed areas of collaboration, including renewable energy investments and utilizing Sri Lanka’s graphite resources for South Korea’s semiconductor and battery industries.

A panel discussion led by Prof. Ajith De Alwis addressed challenges and opportunities for Sri Lanka. Experts highlighted the importance of modernizing intellectual property laws, integrating micro, small, and medium enterprises (MSMEs) into global supply chains. They also called for strategic structural reforms, greater investment in R&D, and leveraging traditional knowledge and geographical advantages to boost economic competitiveness.

The seminar concluded with discussions on policies to stimulate private sector innovation, diversify markets, and promote stronger public-private collaboration in R&D.

**ශ්‍රී ලංකාවට කොරියාවේ නව්‍යකරණ අත්දැකීම්වලින් ගත හැකි ආදර්ශ පිලිබඳ ඇගයීමක් LKI හිදී පැවැත්වේ.**

2024 අගෝස්තු 21

ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සබඳතා සහ ක්‍රමෝපාය අධ්‍යයන ආයතනය (LKI) සහ ශ්‍රී ලංකාවේ කොරියානු තානාපති කාර්යාලය එක්ව 2024 අගෝස්තු 21 වන දින "ඉන්දියානු සාගර කලාපයේ ආර්ථික සුරක්ෂාව: ශ්‍රී ලංකාව සහ කොරියාව අතර සහයෝගීතාවයට ඇති අවස්ථා" යන තේමාව යටතේ සම්මන්ත්‍රණයක් පැවැත්විය. මෙම අවස්ථාවේදී විශේෂයෙන් විද්‍යා, තාක්ෂණ නවෝත්පාදනය සහ ආර්ථික පරිවර්තනය පිළිබඳව දකුණු කොරියාවේ අත්දැකීම්වලින් ශ්‍රී ලංකාවට ගත හැකි ආදර්ශ පිළිබඳ අවධානය යොමු විය.

LKI හි විධායක අධ්‍යක්ෂ, තානාපති රවිනාථ ආර්යසිංහ, ශ්‍රී ලංකාවේ **පර්යේෂණ සහ සංවර්ධන** (R&D) වියදම් වැඩි කර නවෝත්පාදන මත පදනම් වූ සමාජයක් බිහිකිරීමේ අවශ්‍යතාවය අවධාරණය කළේය. කොරියාවේ තානාපතිනී Miyon Lee, කොරියාවේ වර්ධනය සඳහා එහි ආර්ථික සුරක්ෂාව, තාක්ෂණික ක්ෂේත්‍රයේ දියුණුව, බුද්ධිමය දේපළ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ නවෝත්පාදන පරිසර පද්ධතියක් ගොඩනැගීම යන කරුණු අදාළ වන අයුරු පැහැදිලි කරන ලදී. එමෙන්ම ඇය විසින් අපනයනය ඉලක්ක කරගත් ප්‍රතිපත්ති සහ සෘජු විදේශ ආයෝජන ,ශ්‍රී ලංකාවේ ප්‍රගතිය සඳහා වැදගත් වන ක්ෂේත්‍ර බව හඳුනා ගන්නා ලදි.

Asia Foundation Korea Office හි ආචාර්ය Kyungjin Song, දකුණු කොරියාවේ ඓතිහාසික ආර්ථික පරිවර්තනය සහ පුනර්ජනනීය බලශක්ති ආයෝජන සහ දකුණු කොරියාවේ අර්ධ සන්නායක සහ බැටරි කර්මාන්ත සඳහා ශ්‍රී ලංකාවේ මිනිරන් සම්පත් භාවිතා කිරීම ඇතුළුව සහයෝගීතාවයේ යෝජිත ක්ෂේත්‍ර පිළිබඳව සාකච්ඡා කළේය.

මහාචාර්ය අජිත් ද අල්විස් මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැති විද්වත් සාකච්ඡාවකදී ශ්‍රී ලංකාවට ඇති අභියෝග සහ අවස්ථාවන් පිළිබඳව සාකච්ඡා කෙරිණි. බුද්ධිමය දේපල නීති නවීකරණය කිරීම, ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍යම ව්‍යවසායන් (MSMEs) ගෝලීය සැපයුම් දාමයන් වෙත ඒකාබද්ධ කිරීමේ වැදගත්කම විශේෂඥයින් විසින් මෙහිදි අවධාරණය කරන ලදී. උපායමාර්ගික ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ, පර්යේෂණ සහ සංවර්ධන සඳහා වැඩි ආයෝජනයක් සහ ආර්ථික තරඟකාරිත්වය ඉහළ නැංවීම සඳහා සම්ප්‍රදායික දැනුම සහ භූගෝලීය වාසි ප්‍රයෝජනයට ගැනීමේ වැදගත්කමද මෙම සාකච්ඡාවේදී ආමන්ත්‍රණය කෙරිණි.

අවසාන වශයෙන් පුද්ගලික අංශයේ නවෝත්පාදනයන් උත්තේජනය කිරීම, වෙළෙඳපොළ විවිධාංගීකරණය කිරීම සහ R&D හි ශක්තිමත් රාජ්‍ය-පෞද්ගලික සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම සඳහා වන ප්‍රතිපත්ති පිළිබඳ මෙම සම්මන්ත්‍රණයේ දී සාකච්ඡා විය.

ජාතික නවෝත්පාදන නියෝජිතායතනයේ (NIA) ප්‍රධාන නවෝත්පාදන නිලධාරී සහ මොරටුව විශ්වවිද්‍යාලයේ රසායන හා ක්‍රියාවලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අජිත් ද අල්විස් විසින් මෙහෙයවනු ලැබූ විද්වත් මණ්ඩලයට Asia Foundation Korea Office හි නියෝජිත ආචාර්ය Kyungjin Song, කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨයේ පීඨාධිපති සහ බුද්ධිමය දේපල උපදේශක කොමිෂන්

සභාවේ හිටපු සාමාජික, මහාචාර්ය නිශාන්ත සම්පත් පුංචිහේවා , වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් Mr. K.A.Vimalentirarajah සහ Smart Future හි සම-නිර්මාතෘ/අධ්‍යක්ෂ අනුෂ්ක විජේසිංහ මහතා ද එක්විය.

**புத்தாக்கத்தில் கொரியாவின் அனுபவத்திலிருந்து இலங்கைக்கான பாடங்கள் LKI இல் வலியுறுத்தப்பட்டன.**

ஆகஸ்ட் 21, 2024

லக்ஷ்மன் கதிர்காமர் இன்ஸ்டிடியூட் ஆப் இன்டர்நேஷனல் ரிலேஷன்ஸ் அண்ட் ஸ்ட்ராடஜிக் ஸ்டடீஸ் (LKI), தென் கொரிய தூதரகத்துடன் இணைந்து, "இந்தியப் பெருங்கடல் பிராந்தியத்தில் பொருளாதார பாதுகாப்பு: இலங்கைக்கும் கொரியாவுக்கும் இடையிலான ஒத்துழைப்புக்கான வாய்ப்புகள்" என்ற தலைப்பிலான கருத்தரங்கை ஆகஸ்ட் 21 அன்று நடத்தியது. 2024. தென் கொரியாவின் விஞ்ஞானம், தொழிநுட்ப கண்டுபிடிப்புகள் மற்றும் பொருளாதார மாற்றம் ஆகியவற்றில் இருந்து இலங்கை கற்றுக்கொள்ளக்கூடிய பாடங்களை இந்த நிகழ்வு மையப்படுத்தியது.

LKI இன் நிறைவேற்றுப் பணிப்பாளரான தூதுவர் ரவிநாத ஆர்யசின்ஹா, இலங்கையின் குறைந்த ஆராய்ச்சி மற்றும் அபிவிருத்தி (R&D) செலவினங்களை மேம்படுத்துவதுடன், மேலும் புத்தாக்கம் சார்ந்த சமூகத்தை வளர்க்க வேண்டியதன் அவசியத்தை வலியுறுத்தினார். எச்.இ. கொரியாவின் தூதர் Miyon Lee, கொரியாவின் வளர்ச்சியில் பொருளாதாரப் பாதுகாப்பு மற்றும் தொழில்நுட்பத் தலைமையின் பொருத்தத்தை எடுத்துரைத்தார், அறிவுசார் சொத்துரிமைகளைப் பாதுகாப்பதற்காகவும், ஒரு கண்டுபிடிப்பு சுற்றுச்சூழல் அமைப்பை உருவாக்குவதற்காகவும் வாதிட்டார். ஏற்றுமதி சார்ந்த கொள்கைகள் மற்றும் வெளிநாட்டு நேரடி முதலீடு போன்ற இலங்கையின் முன்னேற்றத்திற்கான பகுதிகளை அவர் அடையாளம் காட்டினார்.

தென் கொரியாவின் வரலாற்றுப் பொருளாதார மாற்றம் மற்றும் புதுப்பிக்கத்தக்க எரிசக்தி முதலீடுகள் மற்றும் இலங்கையின் கிராஃபைட் வளங்களை தென் கொரியாவின் குறைக்கடத்தி மற்றும் பேட்டரித் தொழில்களுக்குப் பயன்படுத்துதல் உட்பட, தென்

கொரியாவின் வரலாற்றுப் பொருளாதார மாற்றம் மற்றும் ஒத்துழைப்பின் முன்மொழியப்பட்ட பகுதிகள் குறித்து Asia Foundation Korea அலுவலகத்தைச் சேர்ந்த டாக்டர் கியுங்ஜின் சாங் விவாதித்தார்.

பேராசிரியர் அஜித் டி அல்விஸ் தலைமையிலான குழு கலந்துரையாடல் இலங்கைக்கான சவால்கள் மற்றும் வாய்ப்புகள் குறித்து பேசப்பட்டது. அறிவுசார் சொத்துரிமைச் சட்டங்களை நவீனமயமாக்குதல், குறு, சிறு மற்றும் நடுத்தர நிறுவனங்களை (எம்எஸ்எம்இ) உலகளாவிய விநியோகச் சங்கிலிகளில் ஒருங்கிணைப்பதன் முக்கியத்துவத்தை நிபுணர்கள் எடுத்துரைத்தனர். அவர்கள் மூலோபாய கட்டமைப்பு சீர்திருத்தங்கள், R&D இல் அதிக முதலீடு மற்றும் பொருளாதார போட்டித்தன்மையை அதிகரிக்க பாரம்பரிய அறிவு மற்றும் புவியியல் நன்மைகளை மேம்படுத்துவதற்கு அழைப்பு விடுத்தனர்.

தனியார் துறை கண்டுபிடிப்புகளைத் தூண்டுதல், சந்தைகளைப் பன்முகப்படுத்துதல் மற்றும் R&D இல் வலுவான பொது-தனியார் ஒத்துழைப்பை ஊக்குவிப்பதற்கான கொள்கைகள் குறித்த விவாதங்களுடன் கருத்தரங்கு நிறைவு பெற்றது.